## 2561 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2016 (2017)

### (01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

**S 1**

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

### II කොටස

2. (i) අනුස්සති ධර්ම හතරක් දක්වන්න. (ලකුණු 04 යි)
   (ii) මෙම අනුස්සති ධර්ම ඇතුළත් වන භාවනාව ලියා, එම භාවනා ක්‍රමය කෙටියෙන් හඳුන්වමින් අනුස්සති යන්නෙහි අර්ථය පහදා දෙන්න. (ලකුණු 06 යි)
   (iii) චිත්තේකග්‍රතාවට පමණක් නොව, සතිසම්පජඤ්ඤයෙන් (සිහි නුවණින්) යුතුව දෛනික ජීවිතයේ කටයුතු පවත්වාගෙන යාමට ද අනුස්සති ධර්ම බෙහෙවින් ප්‍රයෝජනවත් වෙයි. අදහස් දක්වන්න. (ලකුණු 08 යි)

3. (i) චතුපාරිසුද්ධි සීලය නම් කරන්න. (ලකුණු 04 යි)
   (ii) ඒවායින් තුනක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)
   (iii) නිර්වාණගාමී ප්‍රතිපදාවේ දී ශීලශික්ෂාව ප්‍රථමයෙන් දැක්වීමේ ඇති වැදගත්කම විමසා ඒ සඳහා ආර්යෂ්ටාංගික මාර්ගයේ දක්වන ලද අංග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

4. (i) සතර සෘද්ධිපාද ධර්ම පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)
   (ii) බෝධිපාක්ෂික ධර්ම යනු කවර ධර්ම සමූහයක් දැයි දක්වා එම ධර්ම සමූහය ඇතුළත් සූත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 06 යි)
   (iii) එම බෝධිපාක්ෂික ධර්ම වැඩීමට ගිහිගෙයින් නික්ම පැවිද්දෙකු ම නොවිය යුතු අතර, ගෘහ ජීවිතය ගතකරමින් වුව ද මෙම ධර්ම ප්‍රගුණ කළ හැකි බව සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි)

5. (i) නීවරණ ධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)
   (ii) ද්වාරත්‍රයෙන් සිදු කරන අකුසල ධර්ම දක්වා ඒවායින් මානසිකව සිදුකෙරෙන අකුසල ක්‍රියා කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)
   (iii) පුද්ගලයා හා සමාජයේ සදාචාරාත්මක පැවැත්මට එම අකුසල ධර්ම අහිතවත් වන ආකාරය කෙසේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

6. (i) ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන දාර්ශනිකයන් හා ශාස්තෘවරුන් විසින් සජීවී - අජීවී ලෝකයේ විවිධ ක්‍රියාකාරිත්වයන් ගැන ඉදිරිපත් කළ වාද හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)
   (ii) එකී ඉගැන්වීම් විචාරයට ලක්කරමින් බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ඉගැන්වීම පෙන්වා දී, ඒ පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
   (iii) "අවිජ්ජාපච්චයා සංඛාරා" (අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංස්කාර හට ගනී) මෙහි සඳහන් අවිද්‍යාව කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

7. (i) ස්කන්ධ පංචකය නම් කරන්න. (ලකුණු 04 යි)
   (ii) ඒවායින් දෙකක් හඳුන්වන්න. (ලකුණු 06 යි)
   (iii) පුද්ගලයා ස්කන්ධ, ධාතු හා ආයතනවලට බෙදා දැක්වීමෙන් සත්ත්ව, පුද්ගල සංඥාව බැහැරවන ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

8. (i) කර්මය විපාක දෙන කාලය අනුව සතරාකාර වෙයි. එම සතරාකාරය ලියා දක්වන්න. (ලකුණු 04 යි)
   (ii) එම සතරාකාර කර්ම විපාක පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
   (iii) කර්මය හා කර්ම විපාකය පිළිබඳව ඇති අවබෝධය මගින් පුද්ගලයා සතු දුර්වලතා මගහරවාගෙන යහපත් වැඩදායි නිවැරදි ජීවිතයක් උදාකර ගත හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි)

***